උකුවෙල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 26 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කර තිබුණු ස්ථිර තැන්පතුවක පොලිය රු.105,671 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පොළිය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුමෙන් එම වැරැද්ද ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් ශේෂය රු.574,317 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පුස්තකාල පොත් ශේෂ වෙනස ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |
| (ඇ) | මාර්ග නඩත්තුව සඳහා විසල් මාතලේ ජල ව්‍යාපෘතියෙන් සභාවට ලැබුණු රු.2,983,365ක මුදල් තැන්පත් ගිණුමේ සටහන් කිරීමකින් තොරව වරිපනම් හා බදු ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්වල ගැළපීම් කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් සහා පොදු වෙළඳපළ ඉදිකිරීම සඳහා රු.1,999,051 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| | 2019 අප්‍රේල් 03 දින වන විටත් ගොඩනැගිල්ල ඉදිකර නොතිබුණද ණයහිමි ලෙස ගිණුම්ගත කර එම වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ආධාර රු.517,956 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | අඩුවෙන් දක්වන ලද ප්‍රමාණය ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර සඳහා වැයකළ රු.1,435,828 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | අඩුවෙන් දක්වන ලද ප්‍රමාණය ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |
| (උ) | පසුගිය වර්ෂයේ ණයගැති හා ණයහිමි නොවන වියදම් සමාලෝචිත වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත නොකිරීමෙන් ණයහිමි ශේෂය රු.5,906,653 ක් හා ණයගැති ශේෂය රු.286,592 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.73,086 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩිපුර දක්වන ලද ප්‍රමාණය ගිණුම්වල ගැළපීම කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදි කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.29,570,981 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා සමඟ සැසඳීමේදී රු.45,972 ක නොසැසඳීමක් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු, උසාවි දඩ හා ස්ථාවර තැන්පතුවල වර්ෂ අවසාන ශේෂය නිවැරදිය. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 3 කට වැඩි ලැබිය යුතු ශේෂයන්ගේ එකතුව රු.47,364 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 3 කට වැඩි ගෙවිය යුතු ශේෂයන්ගේ එකතුව රු.2,794,355 ක් විය. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ පාර්ශවයන්ට ගෙවීමට හෝ එසේ නොමැති නම් ආදායමට ගැනීමට කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.6,450,800 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | විස්තරාත්මක උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ. | තැන්පත් ගිණුමේ නිවැරදි ශේෂය විය යුත්තේ රු.5,845,160 කි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | සභාව සතු මාර්ග ගැසට් පත්‍රයේ පළ කර ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි. | සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පළ කර යාවත්කාලීන කළ යුතු වේ. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන 5 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | වාහන 5 ක හැර ඉතිරි වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,726,210 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,328,696 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,312,344 | 2,556,924 | 2,593,070 | 579,945 | 1,012,345 | 1,793,688 | 1,439,729 | 548,721 |
| (ii) | කුලී | 3,662,000 | 3,870,378 | 3,815,246 | 53,555 | 2,937,000 | 3,495,783 | 3,448,549 | 48,809 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,630,000 | 1,559,535 | 1,559,535 | - | 1,771,000 | 1,393,430 | 1,393,430 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,109,000 | 9,670,262 | 9,833,888 | 1,546,089 | 10,592,000 | 10,437,515 | 9,037,574 | 1,736,577 |
| | එකතුව | 21,713,344 | 17,657,099 | 17,801,739 | 2,179,589 | 16,312,345 | 17,120,416 | 15,319,282 | 2,334,107 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේ වරිපනම් බදු තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයට ද වරිපනම් බදු අය කර තිබුණි. | කඩිනමින් තක්සේරු වටිනාකම් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | දේපළ තක්සේරු වාර්තාව දෝෂ පැවතීම නිසා සභාගත කිරීමට නොහැකි විය. තක්සේරු වාර්තාව සංශෝධනය කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 හා 2015 වර්ෂවලදී රු.1,153,397 ක් වියදම් දරා වරිපනම් ඒකක 6258 ක් සඳහා වරිපනම් තක්සේරුවක් කර තිබුණ ද එකී තක්සේරුව ගැසට් කර වරිපනම් ඒකක සඳහා නව ගාස්තු අය කර ගැනීමේ කටයුතු සිදුකර නොතිබීමෙන් ඒ සඳහා දැරූ වියදම නිෂ්කාර්ය වී තිබුණි. | හඳුනාගත් වරිපනම් ඒකකවලින් වරිපනම් අය කළ යුතු වේ. | වරිපනම් පද්ධතිය දෝෂ සහිත වීම හා ප්‍රමාණවත් ආදායම් පරීක්ෂකවරු නොමැති වීම මීට හේතුවී ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.579,945 ක් වූ අතර රු.1,000 ත් රු.18,424 ත් අතර හිඟ ශේෂ 143 ක් පැවතියද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් ශේෂ අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම හා වරිපනම් නොගෙවන්නන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල අය කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. |

### 2.2.3 ජල ගාස්තු

-------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.1,546,088 ක් වූ අතර රු.1,000 ත් රු.19,072 ත් අතර ශේෂ 423 ක් පැවතුණි. එම ජල සම්බන්ධතාවලින් හිඟ මුදල් අයකිරීමට හෝ විසන්ධි කිරීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම හා ගාස්තු නොගෙවීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | රු.704,471 ක් අය කර ගෙන ඇති අතර ඉතිරිය අය කර ගැනීමට පියවරගෙන ඇත. |
| (ආ) | ජල බිල්පත් නොගෙවීම මත ජල සැපයුම් විසන්ධි කර තිබූ ජල පාරිභෝගිකයින් 255 දෙනෙකුගෙන් රු.233,982 ක හිඟ ජල ගාස්තු අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම හා ගාස්තු නොගෙවීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.707,000 ක් සහ මුද්දර ගාස්තු රු.23,330,710 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබූ හා අයවැය ප්‍රතිපාදන නොවූ රු.8,105,498 ක ඇස්තමේන්තු පිරිවැය වූ සංවර්ධන යෝජනා 35 ක් ක්‍රියාත්මකකර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කිරීමට හා සැලැස්ම අනුව කටයුතු කළ යුතු වේ. | නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නෙමි. |
| (ii) | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් හා වාර්ෂික අයවැය ලේඛනය මඟින්ද ප්‍රතිපාදන සලසා තිබූ රු.12,500,000 ක ඇස්තමේන්තු පිරිවැය වූ ව්‍යාපෘති 8 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |

(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ සහා අරමුදල් ප්‍රතිපාදන යටතේ ඇල්කඩුව නව ජල යෝජනා ක්‍රමය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 29 දින රු.500,000 ක වටිනාකමට ගිවිසුම්ගතව තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණි. 2018 වර්ෂයේදී නැවත රු.2,253,876 කට ඇස්තමේන්තු සකස් කර තිබුණ ද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන නිසි පරිදි සැලසුම් කිරීම හා විධිමත් අධීක්ෂණයකින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතු වේ. | නව යෝජනාවක් ලෙස ඇස්තමේන්තුව ක්‍රියාත්මක වෙමින් පවතී. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ ටොන් 4 ½ ක ප්‍රමාණයෙන් දිරන කසළ ටොන් 1 ක් පොහොර නිෂ්පාදනයට භාවිතා කර ඉතිරි කසළ පරිසරයට හානිදායක අයුරින් බැහැර කර තිබුණි. | පරිසරයට සිදුවන හානිය අවම වන ආකාරයට කසළ කළමනාකරණය කළ යුතු වේ. | කොම්පෝස්ට් භාවිතයෙන් ගෙවතු වගාව දිරි ගැන්වීම සඳහා රාජ්‍ය ආයතනවලට නොමිලයේ පොහොර ලබාදෙන ලදී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්ව 2018 ජුනි 11 දින වන විට දිළිඳුකම පිටුදැකීමේ අරමුණ යටතේ ඉලක්ක හඳුනාගෙන ඇතත් එම ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි. | අරමුණු හඳුනාගෙන ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය කාර්යයන් ඉටුකළ යුතු වේ. | පිළිතුර සපයා නොමැත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතීය මට්ටමේ නිලධාරි තනතුරු 6 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 6 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කළ යුතු වේ. | ද්විතීය මට්ටමේ තනතුරු 2 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 4 ක් සම්පූර්ණ කර ඇත. |
| (ආ) | කම්කරු තනතුරු සඳහා බඳවාගත් 6 දෙනෙකු අදාළ රාජකාරිවල නොයොදවා කාර්යාල රාජකාරිවල යොදවා තිබුණි. | නිසි පරිදි සේවක කළමනාකරණය කිරීම සිදුකළ යුතු වේ. | සේවා අවශ්‍යතාවය මත රාජකාරි පවරා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මැයි සිට සේවයෙන් පහ කළ සේවකයෙකුගේ රු.110,072 ක සේවක ණය ශේෂය හා සැප්තැම්බර් සිට සේවයෙන් පහකළ සේවකයින් දෙදෙනෙකුගේ රු.298,904 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ සේවකයන් දැනුවත් කර ඇත. |
| (ඈ) | 2012 ත් 2017 ත් අතර වර්ෂවල සිට අය නොවී පවතින සේවකයින් 4 දෙනෙකුගේ ණය ශේෂය වූ රු.35,852 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකු බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේදී අධ්‍යාපන සුදුසුකම් සනාථ වී නොතිබියදී ලකුණු ලබාදීම හා සේවා පළපුරුද්ද හා වාචික පරීක්ෂණ සඳහා ද විනිවිදභාවයකින් තොරව ලකුණු ලබාදී තිබුණි. | විනිවිදභාවයකින් යුතුව සුදුසුකම් සලකා බලා ලකුණු ලබාදිය යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 540 කින් 457 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 28 ක් සඳහා පමණි. | නිරන්තරව පරීක්ෂා කර අනුමත කළ සංවර්ධන බලපත්‍රවල ඉදිකිරීම් අවසන් වීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කළ යුතු වේ. | ඉල්ලුම්කරු ඉල්ලීම් කිරීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කරමි. |
| (ආ) | ත්‍රීරෝද රථ ගාස්තු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද අදාළ බල ප්‍රදේශයේ තිබෙන ත්‍රීරෝද රථ සංඛ්‍යාව කොපමණද යන්න සමීක්ෂණයක් කොට ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විමසුම්ගත කරුණු කෙරෙහි අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සුසාන භූමි ඇතුළු ඉඩම් 46 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය නිරවුල් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2005 වර්ෂයේදී සභාවට ලබාදී තිබූ යතුරු පැදි 2 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතී. |

3.4.2 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි ප්‍රමිතියකින් තොරව නිෂ්පාදනය කර තිබූ මේස 4 ක් මිලදී ගෙන රු.160,000 ක් ගෙවා තිබුණි. | නිසි ප්‍රමිතියෙන් යුතු උපකරණ පමණක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ තේක්ක ලී පළමු පංතියේ දැව වන අතර සවි ශක්තියෙන් වැඩිය. අනෙකුත් අඩුපාඩු සැපයුම්කාර |

| | | |
|---|---|---|
| | | ආයතනයෙන් ඉටුකරවා ගනු ලැබේ. |

3.5 ප්‍රසම්පාදනය
---------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂිකව අදාළ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරමි. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාරියපොල කොහොඹිලිවෙල සුබ්‍රමනියම් මහතාගේ නිවස අසළ පාර කොන්ක්‍රීට් කිරීමට අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තාවට අනුව මාර්ගය ආරම්භයේ සිට මීටර 30.5 ක කොටසක ශක්තිය අසමත්ව තිබියදී ව්‍යාපෘතියේ සම්පූර්ණ මුදල වූ රු.438,080 ක් හා අතරුඳවුම රු.48,676 ක් ගෙවා තිබුණි. | වගකීමට බැඳෙන පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හැමර් ටෙස්ට් වාර්තාව ලබාගෙන ඇත. |
| (ආ) | ඇල්කඩුව වත්ත ජල උදාර ප්‍රජාමූල සංවිධානයේ විකල්ප ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ සක්‍යතා වාර්තාව අනුව ව්‍යාපෘතියේ පැවැති ජල පෝෂක ප්‍රදේශයට කිලෝමීටරයක් පමණ ඉහළ ප්‍රදේශයේ නව ජල පෝෂකය මඟින් නළ එලා ටැංකිවලට ගෙන ඒමට යෝජිතව පැවැතියද තේ වතුවලට පහළින් පිහිටි කුඩා ඇල මාර්ගයක් හරස්කර කොන්ක්‍රීට් වැටියක් යොදා ජල නළ පද්ධතියට ජලය සැපයීමට කටයුතු කර තිබුණි. | සක්‍යතා අධ්‍යයනයේදී හඳුනාගත් ආකාරයට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු පැහැදිලිව දක්වා නොමැත. |